# ක්‍රිස්තියානි ධර්මය

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගය**

## *පසුගිය විභාග ප්‍රශ්නෝත්තර*

## *2020*

**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ**

**ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසමේ ප්‍රකාශනයකි.**

# ලකුණු දීමේ පටිපාටිය

1 වන පත්‍රය

| | | ලකුණු |
|---|---|---|
| පළමු වන ප්‍රශ්න පත්‍රයට 1 x 40 බැගින් | = | 40 |
| දෙවන ප්‍රශ්න පත්‍රය සඳහා | | 60 |
| මුළු ලකුණු සංඛාව | = | 100 |

11 වන පත්‍රය

| | |
|---|---|
| 1 වන අනිවාර්ය ප්‍රශ්නයට ලකුණු 02 බැගින් 10 | - 20 |
| 2 වන - 7වන ප්‍රශ්න සඳහා තෝරාගත් ප්‍රශ්න 4 ලකුණු 10බැගින් | - 40 |
| | 60 |

2 - 6 දක්වා සෑම ප්‍රශ්නයක් සඳහා

| | | ලකුණු |
|---|---|---|
| සෑම ප්‍රශ්නයක්ම | අ) | 02 |
| | ආ) | 03 |
| | ඉ) | 05 |
| | | 10 |

7 වන ප්‍රශ්නයේ තෝරාගත් සටහන් ලිවීමේ කොටස් 02ට එක් කොටසකට 5 x**2 - 10**

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසමේ

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2020

# ප්‍රශ්න හා පිළිතුරු

# ක්‍රිස්තියානි ධර්මය 1 හා 11 පැය 3 තුනයි

**සැලකිය යුතුයි**

i **සියලු ම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

ii අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1),(2),(3),(4), යන පිළිතුරු වලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරන්න.

iii **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් , ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

iv එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

**1.** ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ මෙහෙවර ආරම්භ කරනු ලැබුවේ,

(1) සමාරියේ ය. (2) ජෙරුසලමෙහි ය. (3) ගලීලයේ ය. (4) මිසරයේ ය.

**2.** 'දෙවියන් වහන්සේ අප සමඟ ය' යන්නෙහි හෙබ්‍රෙව් වචනය වනුයේ,

(1) එම්මානුවෙල් ය. (2) මරනාතා ය.
(3) රබ්බෝනි ය. (4) ක්‍රිස්තොස් ය.

**3.** ස්නාවක ජොහාන්තුමාගේ සේවයේ, ජේසුස් වහන්සේ හා සම්බන්ධ වැදගත් කරුණක් වන්නේ,

(1) පාද සේදීම ය. (2) පෙරමග සැදීම ය.
(3) ගෝලයෙක් වීම ය. (4) අනතුරු ඇඟවීම ය.

**4.** සමාජයේ සමානාත්මතාවය අගය කළ ස්නාවක ජොහාන් සාමාන්‍ය ජනතාවට දුන් පණිවිඩය කුමක්ද?

(1) ලද වැටුපෙන් සෑහීමට පත්වන්න.
(2) අඳනා දෙකක් ඇති අය නැති අයට දෙන්න.
(3) නියමිත පමණට වඩා බදු අය නොකරන්න.
(4) කිසිවෙකුගෙන් බලහත්කාරයෙන් කිසිවක් පැහැර නොගන්න.

**5.** දිවැසිවැකි සත්‍යයක් බවට පත්වූයේ ස්නාවක ජොහාන්ගේ විශේෂ,

(1) සේවාව තුළිණි.
(2) පවුලේ නෑකම තුළිණි.
(3) ගෝලකම තුළිණි.
(4) වස්ත්‍ර තුළිණි.

**6.** කිතු උපත ශතවර්ෂ ගණනාවක් ජනතා හදවත් තුළ තිබූ බලාපොරොත්තුව මල්ඵල ගැන්වීමක් විය. මෙම කිතු උපත තුළින් සම්පූර්ණත්වයට පත්වන්නේ දේව පුත්‍රයා ය.

(1) මාංශවත්වීම ය.
(2) නැවත පැමිණීම ය.
(3) ස්වර්ගයට ඔසවණු ලැබීම ය.
(4) කුරුසිපත්වීම ය.

7. 'ජේසුස්' යන නාමය.

(1) මුල් කිතුනු සභාව විසින් දෙන ලද්දකි.
(2) ගෝල පිරිස විසින් ජේසුස් වහන්සේගේ සේවය හැඳින්වීමට භාවිතා කිරීමකි.
(3) උන්වහන්සේගේ මෙසියානු කාර්යභාරයට ගැළපෙන්නකි.
(4) ජේසුස් වහන්සේගේ පුනරුත්ථානයෙන් පසු දෙන ලද්දකි.

8. පහත සඳහන් ප්‍රතිචාර සලකන්න.

A – දේව අණට කීකරු වීම.
B – දේව අණට සවන් දී නිහඬ වීම.
C – මරියාණන් තම නිවසට කැඳවාගෙන යෑම.
D – මරියාණන් සමඟ ජෙරුසලමේ නැවතී සිටීම.

ඉහත ප්‍රතිචාර අතුරෙන් ජොසෙප්තුමා දේවදූත පණිවුඩයට දැක්වූ නිවැරදි ප්‍රතිචාරය වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා D පමණි. (4) B හා D පමණි

9. ජේසුස් වහන්සේගේ කුරුසිපත්වීම තුළින් දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයන් අතර තිබුණා වූ සම්බන්ධතාවය,

(1) පලුදු විය. (2) රහස්භාවයට ලක් විය.
(3) සැකයට ලක් විය. (4) නැවත ස්ථාපිත විය.

10. සුවිශේෂ උපත හා ජීවිත පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

- ගව ඔරුවක බා සිටි බිළිඳෙක් ඔබට සම්බන්ධ වන්නේ ය.
- ජොහාන් ඔටුලෝම වස්ත්‍රයෙන් සැරසී ඉණ වටා හම් පටියක් බැඳ සිටීම.
- ජෝසෙප් හා මරියතුමියට තානායමක ලැගුම් ගැනීමට ඉඩ නොලැබීම.
- ජොහාන්ගේ ආහාරය වූයේ වන මී සහ පළගැටියන්ය.

මෙයින් අදහස් කෙරෙනුයේ,

(1) දිළිඳුකම අත්‍යවශ්‍ය නොවන බවකි.
(2) දිළිඳුකමට තල්ලු වීමයි.
(3) දිළිඳුකම ප්‍රතික්ෂේප කිරීමකි.
(4) දිළිඳුකම වැළඳගැනීමකි.

11. ජේසුස් වහන්සේගේ මෑණියන්, සහෝදර සහෝදරියන් වීමට අප කළ යුත්තේ,

(1) නිතර දේවස්ථානයට යෑම ය. (2) චාරිත්‍ර වත්පිළිවෙත් රැකීම ය.
(3) සමාජ සේවයේ පමණක් නිරත වීම ය. (4) දේව කැමැත්තට සවන් දී ඒ අනුව ක්‍රියා කිරීම ය.

12. "ඔබ මා කවරෙකු කියා කියන්නහු ද? යන ජේසුස් වහන්සේගේ ප්‍රකාශයෙන් කිතුනු අපට ලබාදෙන පණිවුඩය කුමක්ද?

(1) ජේසුස් වහන්සේ සමඟ අපේ පෞද්ගලික සම්බන්ධතාවය වැදගත් වන බව.
(2) ජේසුස් වහන්සේ ගැන මනා දැනීමක් අවශ්‍ය බව.
(3) ජනප්‍රියභාවය වැදගත් බව.
(4) අන් අය සමඟ අප සසඳා බැලීම වැදගත් බව.

13. නාසරෙත්හී සිනගෝගයේ දේශනයෙන්, ශාරපත්හි වැන්දඹුවන් හා නාමන් පිළිබඳ නිදසුන් ගෙනහැර පෑමෙන් ඉදිරිපත් කළ ජේසුස් වහන්සේගේ පණිවුඩය,

(1) වැන්දඹුවගේ ඇදහිල්ල විශේෂ බව ය.
(2) දේව රාජ්‍යය අන්‍ය ජාතීන්ට ද විවෘත බව ය.
(3) නාමන් එලියා වෙත පැමිණ සුවය ලැබූ බවය.
(4) ජුදා දේශයේ අන්‍ය ජාතීන් ද සිටින බව ය.

**14.** වාචික සම්ප්‍රදාය අනුගමනය කළ කණ්ඩායමක් වන්නේ,

(1) සද්දුසිවරුය. (2) එසීනවරු ය. (3) පරිසිවරු ය. (4) සෙලට්වරු ය.

**15.** ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් විවිධ පසුබිම්වලින් තෝරාගත් අය විය. මෙමගින් අපට ඉදිරිපත් කෙරෙන වැදගත් ආදර්ශය කුමක්ද?

(1) දේව වචනය ප්‍රකාශ කිරීමේ දී පසුබිම වැදගත් බව.
(2) ජුදාහි විවිධ පසුබිම් පිළිගැනීම.
(3) ලාංකික වැසියන්ගේ පසුබිම.
(4) දේව වචනය ප්‍රකාශ කිරීමට තරාතිරම අනවශ්‍ය බව.

**16.** ජේසුස් වහන්සේ කණගාටු වී වැළපුණේ,

(1) ජෙරුසලමේ ජනතාව ගැන ය. (2) ජෙරුසලමේ දේව මාළිගය ගැනය.
(3) ජෙරුසලමේ පීඩිත දුගී ජනයා ගැන ය. (4) ජෙරුසලම් නුවර ගැනය.

**17.** ජේසුස් වහන්සේගේ ඉගැන්වීමේ හරය වූයේ කුමක්ද?

(1) දේව රාජ්‍යය. (2) දේශපාලන නිදහස.
(3) ජුදා නීතිය. (4) ජෙරුසලමේ දේව මාළිගය ප්‍රතිසංස්කරණය.

**18.** 'මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේ ය.' මෙයින් ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ පණිවුඩය වන්නේ,

(1) ආහාර මෙන් ඇඳුම් පැළඳුම් ද අවශ්‍ය බවයි.
(2) දෙවියන් වහන්සේ කෑම සපයන බයයි.
(3) දේව වචනයෙන් ද අප පරිපූර්ණ වීම වැදගත් බවයි.
(4) ගල්, රොටි වලට පරිවර්තනය කළ හැකි බවයි.

**19.** දහම් සේවයේ නිරත වූ 70 දෙනා ආපසු ආවිට ජේසුස් වහන්සේ අගය කළේ කුමක්ද?

(1) ඔවුන්ගේ චාම් දිවි පෙවෙත. (2) දෙදෙනා බැගින් සේවයේ නිරත වීම.
(3) සුව කිරීම හා දුෂ්ට ආත්ම දුරු කිරීම. (4) ඔවුන්ගේ නාමය ස්වර්ගයේ ලියා තිබීම.

**20.** කුරුසිපත්ව සිටි පසුතැවිලි වූ වරදකරුවාට ජේසුස් වහන්සේ දැක් වූ ප්‍රතිචාර මගින් අප ඉගෙන ගන්නා පාඩම වන්නේ,

(1) අවස්ථාවට අනුකූලව හැඩ ගැසීමට තීක්ෂණ වීම ය.
(2) දේව සමාවට සීමාවක් නොමැති බව ඒත්තු ගැනීමය.
(3) ගැළවීමට වෙනත් ක්‍රියාමාර්ගයක් ගත යුතු බවය.
(4) පීඩිතයන් සමග අපේ අනන්‍යතාවය හඳුනා ගැනීමය.

**21.** දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳ ජේසුස් වහන්සේ වදාළ වපුරන්නාගේ උපමා කථාව මගින් ඉස්මතු කෙරෙන වැදගත් සත්‍යය වන්නේ,

(1) අහසේ පක්ෂීන්ගෙන් බාධා පැමිණෙන බවය.
(2) නිසි අවබෝධයක් නොමැති විට වර්ධනය ඇණහිටින බවය.
(3) ලෞකික සැප සම්පත් බාධක වන බවය.
(4) දෙවියන් වහන්සේ බාධක අභිබවා දේව රාජ්‍යයෙ' ව්‍යාප්ත කරන බවය.

**22.** කොරින්ති වාසින්ට යවන ලද ලිපියෙන් පාවුල් තුමා වැදගත් දීමනාවක් ලෙස ඉස්මතුකර දක්වා ඇත්තේ කුමක්ද?

(1) දිවැසි වැකි දෙසීම. (2) දන් දීම
(3) ප්‍රේමය (4) දැනුම

23. "වග වලසුන් මැදට බැටළු පැටවුන් යවන්නාක් මෙන් මම ඔබ යවමි." යන ජේසුස් වහන්සේගේ ප්‍රකාශයේ හරය වූයේ,

(1) තනිව සිටින්න යන්නයි. (2) කණ්ඩායමක් ලෙස සිටින්න යන්නයි.

(3) අභියෝගවලට මුහුණ පාන්න යන්නයි. (4) බලවත් වන්න යන්නයි.

24. ජේසුස් වහන්සේගේ දෙවන පැමිණීම හෙවත් යුගාන්තය පිළිබඳව අපට අනාවරණය කෙරෙන ප්‍රධාන අභියෝගය කුමක්ද?

(1) යුගාන්තයේ ජයාන්විතභාවය සඳහා නිතර සූදානමින් සිටිය යුතු වීම.
(2) යුගාන්තයේ ලකුණු සියල්ල නිසි පරිදි අධ්‍යයනය කළ යුතු වීම.
(3) යුගාන්තයේ විවිධ ආපදාවලට මුහුණ පෑමට සිදුවීම.
(4) ලෞකික දෑ පසෙක දමා යුගාන්තය ගැන පමණක් මෙනෙහි කළ යුතු වීම.

25. පහත සඳහන් වන්නේ පරිසිවරු සහ ලියන්නන් ජේසුස් වහන්සේ සමඟ කරනු ලැබූ සාකච්ඡාවල ඇතුළත් කරුණුය.

A – දේව රාජ්‍යය පදනම් වී ඇත්තේ ප්‍රේමය මතය.

B – දෙවියන් වහන්සේ සමඟ සබැඳියාව චාරිත්‍රවලට වඩා වැදගත්ය.

C – දෙවියන් වහන්සේටත් වස්තුවටත් සේවය කළ හැකිය.

D – දේව වචනයේ ආත්මිකභාවය අවශ්‍ය නොවේ.

ඉහත සඳහන් කුමන කරුණු අපේ ජීවිතවලට වැදගත් වේද?

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) C හා D පමණි.

26. රූප විපර්යාසයේ දී ජේසුස් වහන්සේගේ දෙපසින් දර්ශනය වූ මෝසෙස් සහ එලියා, ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳව අපට හෙළි කරන සත්‍යය වන්නේ,

(1) ජෙරුසලමේ දී ජේසුස් වහන්සේගේ මරණය තුළින් දෙවියන් වහන්සේගේ කැමැත්ත සම්පූර්ණ වීමයි.
(2) ජේසුස් වහන්සේ වඩින්නට සිටි මෙසියස් වීමයි.
(3) ජේසුස් වහන්සේගේ ජීවිත පූජාව මගින් සියලු දිවැසි වැකි පූර්ණ වීමයි.
(4) දාවිත්ගේ පරපුරෙන් පැවත එන ගැළවුම් කරුවාණෝ වීමයි.

27. ජුදස්ගේ ක්‍රියාකලාපය මගින් අප ලබන අභියෝගය කුමක් ද?

(1) ජේසුස් වහන්සේට සේවය කිරීම මගින් අපේ අවශ්‍යතා සපුරා ගැනීම.
(2) මූල්‍යමය ලාභ අපේක්ෂා කිරීම.
(3) ලෝකයා සමඟ පක්ෂපාති වීම.
(4) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් ගැන නිසි අවබෝධයක් ලබා ඒ අනුව ක්‍රියා කිරීම.

28. කිතුනු බලාපොරොත්තුව පදනම් වී ඇත්තේ,

(1) තමකම වටාය. (2) සමාජය වටාය. (3) දේව කැමැත්ත වටාය. (4) ලොව වටාය.

29. රෝම අධිරාජ්‍යය විසින් ජනතාව පිට පැන වූ අධිකම බර වූයේ කුමක් ද?

(1) වහල් බව (2) බදු බර (3) පූජා ඔප්පු කිරීම. (4) ආගමික වතාවත් පැවැත්වීම.

30. ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තියට සම්බන්ධ යහපත් ප්‍රතිචාර දැක්වූ පුද්ගල කාණ්ඩය දැක්වෙන්නේ,

(1) කිරේනියේ සීමොන්, පේදුරු සහ තෝමස්.
(2) සොරුන් දෙදෙනා, ජුදස් සහ ජෙරුසලමේ කාන්තාවන්ය
(3) පිලාත්, ජුදස් සහ ජාකොබ්ය.
(4) අරමාතියේ ජෝසැප්, කිරේනියේ සීමොන් සහ ශාතාධිපතියාය.

**31.** ආබ්‍රහම්ගේ ජීවිතයේ සුවිශේෂී චරිත ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A – දේව ඇදහිල්ලෙන් දේව කැඳවීමට අවනත වීම.

B – තම පුතණුවන් පවා පිදීමට සූදානම් කිරීම.

C – දෙවියන් වහන්සේ සමඟ ගැඹුරු සබඳතාවයකට යොමු වීම.

D – චර්ම ඡේදනය වැදගත් ලකුණක් කර ගැනීම.

මෙයින් කිතුනුවා අනුගමනය කළ යුතු චරිත ලක්ෂණ වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) C හා D පමණි.

**32.** පාවුල්ට දමස්කය බලා යාමට අවශ්‍ය වූයේ ඇයි ?

(1) කිතුනුවන් අත්අඩංගුවට ගැනීමට. (2) කිතුනුවන්ට ගල් ගැසීමට.
(3) සිනගෝග වල දේශනා කිරීමට. (4) කුඩාරම් සැදීමේ නිරත වීමට.

**33.** "මාගේ නාමය විජාතීන් ද, රජුන් ද, ඊශ්‍රායෙල් පුත්‍රයන් ද වෙත ගෙන යෑමට මා විසින් තෝරාගත් භාජනයකි." උත්ථාන වූ ජේසුස් වහන්සේ මෙලෙස ප්‍රකාශ කළේ කා පිළිබඳව ද?

(1) තෝමස්. (2) පේදුරු. (3) පාවුල්. (4) බර්නබස්.

**34.** සමාජයේ පැවති අයුක්තිය හා අසාධාරණයට විරුද්ධව කථා කිරීමට නායකත්වය ගැනීම සඳහා දෙවියන් වහන්සේ කැඳවූ දිවැසිවරයා කවුද?

(1) යෙසායා. (2) මීකා. (3) හොසියා. (4) ආමොස්.

**35.** දර්ශනයකින් දෙවියන් වහන්සේගේ සුවිශුද්ධ බවත් මනුෂ්‍යයාගේ පාපි ස්වභාවයත් වටහා ගෙන සමාජය කරා පිවිසුන දිවැසිවරයා කවුරුන්ද?

(1) ජෙරමියා. (2) යෙසායා. (3) හොසියා. (4) ආමොස්.

**36.** බහුවිධ සමාජයක වෙසෙන කිතුනුවා සිරිත් චාරිත්‍ර අනුගමනය කිරීමේ දී සැලකිලිමත් විය යුත්තේ,

(1) අන්‍ය ආගමික වතාවත්වලට සහභාගි වීමටයි.
(2) අන්‍ය ආගමිකයන් අප විශ්වාසයට හරවා ගැනීමටයි.
(3) චාරිත්‍ර අවශ්‍ය විට අනුගමනය කිරීමට යොමු වීමටයි.
(4) කිතුනු අනන්‍යතාවයට හා වටිනාකම්වලට බාධා නොවන පරිදි ක්‍රියාකිරීමටයි.

**37.** "මම මිනිසුන්ගේ ජීවිතවලට ආදරය කරමි. ඝාතනය හෙළා දකිමි." මෙසේ පැවසුවේ කවුද?

(1) මයිකල් ලැප්ස්ලි දේවගැති (2) තිස්ස බාලසූරිය දේවගැති
(3) චන්ද්‍ර ප්‍රනාන්දු දේවගැති (4) ජෙරාඩ් ද සිල්වා දේවගැති

**38.** පාවුල්තුමාගේ ධර්මදූත මෙහෙවරට පිටුවහලක් වූ ජීවිත පසුබිමෙහි ඇතුළත් අංග මොනවා ද?

(1) පරිසියෙක් වීම, රෝම පුරවැසිභාවය සහ කුඩාරම් සැදීමේ කර්මාන්තය.
(2) දර්ශනවාදය, රෝම පුරවැසිභාවය සහ නායක පූජක වරුන්ගේ අනුමැතිය.
(3) පරිසි නීතිය අනුගමනය කිරීම, තාර්සස් නුවර උපත සහ ස්තෝයික දර්ශනවදන් ඇසුර
(4) සිනගෝගවල දේශනය, පරිසියෙක් වීම සහ නායක පූජකවරුන්ගේ අනුමැතිය

**39.** 'ජේසුස් වහන්සේ ජීවමානය' යන අපෙක්ෂාව අපෙන් ගිලිහී ගියහොත්,

(1) අප ක්‍රිස්තුස් වහන්සේගෙන් දුරස්ථ වීම සිදු වේ. (2) අපගේ ඥාණය වර්ධනය වේ.
(3) අප අන්‍යයන්ගේ ප්‍රතික්ෂේපයට ලක් වේ. (4) අප සමාජයේ ජනප්‍රිය භාවයට පත් වේ.

**40.** දේව රාජ්‍යයේ ලකුණු හෙවත් ප්‍රාතිහාර්යයන් ජේසුස් වහන්සේ විසින් සිදු කරන ලද්දේ කුමක් නිසා?

(1) ජනතාව තමා වෙතට රැස්කර ගැනීමට
(2) අනුගාමිකයන්ට ද ප්‍රාතිහාර්ය සිදුකිරීමට අනුබල දීමට
(3) ලෙඩ රෝග පිළබඳව එවකට සමාජ මත ස්ථාපිත කිරීමට
(4) ජනතාව කෙරෙහි තිබූ ප්‍රේමය හා දයානුකම්පවට

## ලකුණු දීමේ පටිපාටිය - 1 පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 11 | 4 | 21 | 4 | 31 | 2 |
| 02 | 1 | 12 | 1 | 22 | 3 | 32 | 1 |
| 03 | 2 | 13 | 2 | 23 | 3 | 33 | 3 |
| 04 | 2 | 14 | 3 | 24 | 1 | 34 | 4 |
| 05 | 1 | 15 | 4 | 25 | 1 | 35 | 2 |
| 06 | 1 | 16 | 4 | 26 | 3 | 36 | 4 |
| 07 | 3 | 17 | 1 | 27 | 4 | 37 | 3 |
| 08 | 2 | 18 | 3 | 28 | 3 | 38 | 1 |
| 09 | 4 | 19 | 4 | 29 | 2 | 39 | 1 |
| 10 | 4 | 20 | 2 | 30 | 4 | 40 | 4 |

## ක්‍රිස්තු ධර්මය II

## ලකුණු දීමේ උපදෙස්

1 වන අනිවාර්ය ප්‍රශ්නයට කොටස් 10 ක් ඇතුළත්ය. එක් කොටසකට ලකුණු 02 බැගින් පිරිනැමේ

10 X2 = 20

සෙසු තෝරාගත් ප්‍රශ්නවලට ලකුණු පිරිනැමිය යුත්තේ -

| | ලකුණු |
|---|---|
| (i) වන කොටසට | 02 |
| (ii) වන කොටසට | 03 |
| (iii) වන කොටසට | 05 |
| මුළු ලකුණු සංඛ්‍යාව | 10 |
| තෝරා ගත් ප්‍රශ්න 4 ට | 10 X 4 = 40 |

II වන ප්‍රශ්න පත්‍රයේ මුළු ලකුණු සංඛ්‍යාව 60

# ක්‍රිස්තියානි ධර්මය 11

## මෙම පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ

### 1. ප්‍රශ්නය

**(i)** (අ) ස්තුතිවන්තභාවයේ වැදගත්කම ඉස්මතු කිරිමට ජේසුස් වහන්සේ පාදක කර ගත්තේ කුමන ප්‍රාතිහාර්ය සිද්ධිය ද ?

(ආ)ස්තුති කිරීමට ආපසු පැමිණියේ කවුද ?

(අ) ලාදුරු රෝගීන් 10 දෙනා සුවකිරීම.

(ආ)ආපසු පැමිණියේ සමාරිතයෙක් / අන්‍ය ජාතිකයෙක්

**(ලකුණු 02)**

**(ii)** ලෞකික පුද්ගලික අවශ්‍යතා ගැන කරදරවීමේ නිෂ්ඵලතාවය ගෙන හැර පෑමට ජේසුස් වහන්සේ උපයෝගි කරගත් රූපක දෙක මොනවාද ?

* කෙතේ මානෙල් වැඩෙන සැටි බලන්න ......................

ආකාශයේ පක්ෂීන් / කපුටන් උන් අටුවල රැස් කරන්නේවත් නැත. ....................

**(ලකුණු 02)**

**(iii)** එවකට ජුදා සමාජයේ කාන්තාවන්ගේ තත්ත්වය නගා සිටුවාලීමට ජේසුස් වහන්සේ ගත් පියවර දැක්වෙන අවස්ථා දෙකක් ඉදිරිපත් කරන්න.

- ❖ ගෝලකමට කාන්තාවන් ඇතුල් කර ගැනීම.
- ❖ සමාජ තහංචි ඉවත දමා සංවාදයේ යෙදීම හා පිළිගැනීම - සමාරිය ස්ත්‍රිය
- ❖ සුව කිරීම ආබ්‍රහම්ගේ දියණිය ලෙස ප්‍රකාශය - සබත් දින කුදු ස්ත්‍රිය සුව කිරීම
- ❖ ඇදහිල්ල පිළිබඳව අගය කිරීම - සළුවට අතගැසූ ස්ත්‍රිය
- ❖ පරිත්‍යාග පිදීම අගය කිරීම - වැන්දඹුවගේ පඬුර
- ❖ පව්කරුවන් ලෙස කොන් කළ අයව අගය කිරීම - පව්කාර ස්ත්‍රිය / සිමියොන් නම් පරිසියාගේ නිවසේ ක්‍රියාවලිය
- ❖ යහපත් දේ තෝරා ගැනීම අගය කිරීම - බෙතනියේ නිවසේ මරියා හා මාර්තා

**(ලකුණු 02)**

**(iv)**(අ) දුක් උසුලන සේවකයා පිළිබඳ අනාවැකිය පළ කළේ කුමන දිවැසිවරයා ද?

(ආ) නව ගිවිසුම අනුව එම කාර්යභාරය සම්පූර්ණත්වයට පත් කළේ කවුරුන් විසින්ද?

(අ) යෙසායා (ආ) ජේසුස් වහන්සේ

**(ලකුණු 02)**

**(v)** කිතුනු පවුලක දරුවන් තුළ තිබිය යුතු ප්‍රධාන වගකීමක් සහ දෙමාපියන් දරුවන් කෙරෙහි සපුරාලිය යුතු යුතුකමක් ලියා දක්වන්න.

වගකීම - දෙමාපියන්ට සමිදාණන් තුළ කීකරු වන්න / ඔබේ මවටත් පියාටත් ගෞරව කරන්න.

යුතුකම - දේව තිළිණයක් වන දරුවන්ට ආදරය දැක්වීම / අවශ්‍යතා සපුරාලීම / ඔවුන්ගේ ජීවිත විනයානුකූල හැඩගැස්වීම

**(ලකුණු** 02)

**(vi)** "මේ වතුර බොන සෑම කෙනෙකුටම නැවත පියාසය ඇති වන්නේය. එහෙත් මා දෙන වතුර බොන කවර කෙනෙකුටවත් නැවත කිසිකලෙකත් පිපාස ඇති නොවන්නේය."

(අ) ජේසුස් වහන්සේ මෙම වදන් පැවසුවේ කා හට ද?

(ආ) තද අකුරින් යොදා ඇති පාඨයෙහි අර්ථය සඳහන් කරන්න.

(අ) සමාරිය ස්ත්‍රියට

(ආ) ජේසුස් වහන්සේ නැමැති ජීවන ජලය / සදාතන ජීවනය / දේව වචනය

**(ලකුණු** 02)

**(vii)** (අ) සැබෑ සාමය ස්ථාපිත වන්නේ කවර පදනමක් මතද?

(ආ) හෙබ්‍රෙව් භාෂාවෙන් සාමය සඳහා භාවිත වූ වචනය කුමක්ද?

(අ) යුක්තිය හා සාධාරණත්වය / යුක්තිය හා ධර්මිෂ්ඨකම

(ආ) ෂලෝම්

**(ලකුණු** 02)

**(viii)** නිකාය වශයෙන් බෙදීඇති කිතුනු සභාව එක්සත් කිරීමට යොමු වී ඇති ශ්‍රී ලංකාවේ පවතින කාන්තා හා පුරුෂ සංවිධානය බැගින් නම් කරන්න.

තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය (YWCA) / තරුණ ක්‍රිස්තියානි සංගමය (YMCA)

**(ලකුණු** 02)

**(ix)** පෙන්තකොස්ත දිනයෙන් පසු පේදුරුතුමාගේ සුව කිරීමේ මෙහෙවරක් සහ විජාතීන් වෙත යොමු වූ අවස්ථාවක් ඉදිරිපත් කරන්න.

❖ සුදර්ශන දොරටුව අසල සිටි කොරාව සුවපත් කිරීම.

❖ පේදුරු තුමා කොරනේලියස්ගේ නිවසට ගොස් දේශනා කිරීම හා බෞතීස්ම කිරීම.

**(ලකුණු** 02)
**(මුළු ලකුණු** 20)

**(x)** ඔබ, ජීවිතයේ අභියෝග වලට මුහුණ දෙන අවසථාවලදී පවුල්තුමාගේ ජීවිතය ආදර්ශ කරගෙන, ක්‍රිස්තුස්වහන්සේ සඳහා සාක්ෂි දරන අන්දම පිළිබඳව උදාහරණ **දෙකක්** ලියන්න.

- ❖ රෝමයට ගිය ගමනේ දී නැවේ සිටි අයව දිරි ගැන්වීම - මෙවන් පීඩිත අවස්ථාවක අප ඇසුරු කරන අයව දිරිගැන්වීම. / ජීවිත පැවැත්මෙන් සාක්ෂි දැරීම

- ❖ පාවුල්තුමා ජේසුස් වහන්සේ ගැන සාක්ෂි දරමින් කිසිවෙක් විනාශ නොවන බව පැවසීම - එසේ ම අප ද ජේසුස් වහන්සේගේ මඟපෙන්වීම අනුව අන්‍යයන්ව දේව වචනයෙන් පෝෂණය කරමින් මඟ පෙන්වීම.

- ❖ පාවුල් තුමා කුණාටුව අවස්ථාවේ ක්‍රියා කළ ආකාරය - අර්බුද / අභියෝග ශමුවේ ඇදහිල්ලෙන් ස්ථිරව සිටිමින් සාක්ෂි දැරිය යුතුය.

- ❖ පාවුල්තුමා මෝල්ටාවේ ක්‍රියා කළ අයුරින් - යාච්ඤාවෙන්, විශ්වාසයෙන් අප ද සාක්ෂි දැරිය යුතුය.

- ❖ පාවුල් තුමා ප්‍රඥාවෙන් සාක්ෂි දැරීම - ඕනෑම පුද්ගලයකු ඉදිරියේ තරාතිරම් නොබලා සාක්ෂි දැරිය යුතුය.

**(ලකුණු 02)**
***(මුළු ලකුණු 20 යි )***

2. ජේසුස් වහන්සේ ගෙත්සෙමන උයනට වැඩම කළේ කුමන අවස්ථාවේ ද? ඒ කුමක් සඳහා ද?

- ❖ ජේසුස් වහන්සේ ගෙත්සෙමනට උයනට වැඩම කළේ අවසාන රාත්‍රි භෝජනයෙන් පසුව
- ❖ යාච්ඤාවෙන් සවිමත් වීම සඳහා / දේව කැමැත්ත විමසීමට හා කීකරු වීමට / කුරුසි පූජාවට සූදානම් විම සඳහා මඟ පෙන්වීම ද ශක්තිය ද ධෛර්‍යය ද ලබා ගැනීමට

**(ලකුණු 02)**

**(i)** නිදා සිටි ගෝලයන් වෙත ආපසු පැමිණි ජේසුස් වහන්සේ ප්‍රශ්න කළේ කුමක් ද? ඔවුන්ට දුන් අවවාදය කුමක් ද?

- ❖ "ඔබ නිදා සිටින්නේ මන්ද? " / "පරීක්ෂාවට නොපැමිණෙන පිණිස නැගිට යාච්ඤා කරන්න." (ලූක් 22:46)

**(ලකුණු 03)**

**(ii)** වත්මන් සමාජයේ අප මුහුණ පාන අභියෝග මධ්‍යයේ ජීවිත හැඩගස්වා ගැනීමට, ගෙත්සෙමන උයනේ සිදුවීම් හා ජේසුස් වහන්සේගේ යාච්ඤාව උපකාර වන්නේ කෙසේදැයි කරුණු **පහක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

* යාච්ඤාවෙන් මඟ පෙන්වීම සෙවීම.

- ❖ දේව කැමැත්තට අවනත වීම
- ❖ අර්බුද / අභියෝග හමුවේ යාච්ඤාවෙන් දෙවිඳුන්ට භාරවිම.
- ❖ පාපයට නොවැටී ජීවිතය හැඩගස්වා ගැනිමට මඟ පෙන්වීම.
- ❖ දේව කැමැත්ත පිළිබඳ විශ්වාසයෙන් හා බලාපොරොත්තුවෙන් සිටීම.
- ❖ දිරිය හා සවිය යැදීම / ස්තුතිවන්ත වීම

**(ලකුණු 05)**
***(මුළු ලකුණු 10)***

3. **(i)** ගීතාවලියේ 23 වන ගීතයට අනුව බැටළු එඬේරාගේ යහපත් ගති ලක්ෂණ **දෙකක්** ලියන්න.

- ❖ අගහිඟ නැත / දමිටු මග ගෙන යාම / බියක් සැකයක් නැත / ආරක්ෂාව / සතුරන්ගෙන් ගැළවීම / දයාව හා කරුණාව දිවි හිමියෙන් ම / පෝෂණය / ආශිර්වාදය

**(ලකුණු 02)**

**(ii)** යහපත් එඬේරාණන් වන ජේසුස් හට රැළ විසින් ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේ දැයි කරුණු **තුනක්** ඉදිරිපත් කරන්න.

- ❖ හඬට සවන් දීම * හඬ හඳුනාගැනිම * විශ්වාසවන්තව හා කීකරුවී * පසුපස යෑම.
- ❖ යහපත් එඬේරා හඳුනා ගැනීම * එඬේරාට අවනත නොවීම නිසා සිදු වන අනතුරු හඳුනාගැනීම.

**(ලකුණු 03)**

**(iii)** එදා සමාජයේ ජේසුස් වහන්සේ යහපත් එඬේර ලක්‍ෂණ ක්‍රියාත්මක කළ අවස්ථා **පහක්** ඇසුරෙන් ඔබ එම යහපත් එඬේර ගුණාංග අනුගමනය කරන්නේ කෙසේ දැයි පහදන්න.

- ❖ පෝෂණය - (පන්දහසකට කෑම දීම) අවශ්‍යතා ඇති අයට පිහිටවීම / ආහාර දීම
- ❖ සොයා යෑම - (නැති වූ බැටළුවා) වැරදි මඟ ගිය අයව සොයා ගොස් යහ මඟට ගැනීම.
- ❖ සතුරන්ගෙන් ගැළවීම - (පීඩිතයන් මුදාලීම) විවිධ සමාජ තහංචිවලට එරෙහිව හඬක් නැගීම.
- ❖ රෝගීන්ට සුවය (ලාදුරු රෝගීන්ට) රෝගීන්ට උපස්ථාන කිරීම, ඔවුන් වෙනුවෙන් දෙවිඳුන් යැදීම.
- ❖ අසීමිත ප්‍රේමය (අකීකරු පුත්‍රයා) ප්‍රේමය දැක්වීම.
- ❖ සැවොම පිළිගැනීම (පවුකාර ස්ත්‍රිය) ජාතිභේද නොතකා බහුවිධ සමාජය තුළ සැමදෙනා සමඟ සහජීවනයෙන් හා ප්‍රේමයෙන් දිවි ගෙවීම.
- ❖ දිවි පිදීම

**(ලකුණු 05)**
***(මුළු ලකුණු 10)***

4 **(i)** ජේසුස් වහන්සේ සිය ජීවිත කාලය හා සේවා කාලය තුළ දී කමාව දැක්වූ අවස්ථා **දෙකක්** කෙටියෙන් ලියන්න.

කුරුසිය මතදී / පව්කාර ස්ත්‍රියට ගල් ගසන අවස්ථාවේ දී / ගෙත්සෙමනේ දී උන්වහන්සේව අත්අඩංගුවට ගැනීමේ දී කන කැපුව දාසයාට සුවය / අංශභාගි රෝගියාගේ පව් කමාකිරීම / අපහස හා චෝදනා නැගූ නායක පූජකයන් හා පරිසිවරුන් වැනි අයට සමාව

**(ලකුණු 02)**

**(ii)** කමා නොවූ දාසයාගේ උපමා කථාව ඇසුරෙන් පහත ඒවා විස්තර කරන්න.

(අ) දාසයාගේ ඉල්ලීම.
(ආ) ස්වාමියාගේ ප්‍රතිචාරය
(ඉ) තමා හට ණය වී සිටි පුද්ගලයා කෙරෙහි දාසයා දැක්වූ ප්‍රතිචාරය

(අ) "ණය ප්‍රමාණය ගැන ඉවසමින් කමාව දෙන්නැයි "
(ආ) ස්වාමියා දාසයාට අනුකම්පා කොට ඔහු ණය බරින් නිදහස් කිරිම
(ඉ) තමාට ණය වී සිටි පුදගලයා එම ණය නොගෙවූ බැවින් ඔහුව සිරයට දැමීම.

**(ලකුණු 03)**

**(iii)** ඉහත සඳහන් උපමා කථාව මඟින් කමාව පිළිබඳ ඉදිරිපත් කෙරෙන ඉගැන්වීම් පහක් අපගේ දෛනික ජීවිතයේ යහපත් ලෙස ක්‍රියා කිරිමට යොදා ගත යුත්තේ කෙසේ දැයි පහදන්න.

* කමාව යැදීම - පසුතැවී වරද වටහා ගැනීම යාච්ඤාවෙන් කමා යැදීම.
* කමාව දීම දේව ගුණාංගයක් - අපට වැරදි කරන අයට වෛරයෙන් තොරව කමාව දීම
* කමාව දීමට හා කමාව ලැබීමට නැඹුරු වන අප දේව කැමැත්ත ඉටු කරන බව - අපට වැරදි කරන අයට කමා කිරීම තුළින් අපට කමා ලැබෙන අතර අපගේ සිත තුළ සාමය රජයයි.
* කමාව දීම හා කමාව ලැබීම තුළ ජීවිතය අලුත් වන බව - පාපයෙන් තොර ජීවිතයක් නිසා සෑම දෙනා සමඟ ප්‍රේමයෙන් දිවි ගෙවීමට හැකි වන අතර ජේසුස් වහන්සේගේ ප්‍රේමය විදහා දැක්විය හැකිය.
* කමාව අප කාටත් අවශ්‍ය බව - කමාවීමේ ආත්මයකින් ජීවත් වන විට ජීවිතයට වටිනාකමක් අගයක් ඇති වේ.
* කොන්දේසි රහිතව කමාව වීම - සමිඳුන්ගේ යැදුම.

**(ලකුණු** 05)

**(මුළු ලකුණු** 10)

5 **(i)** සේවකයන් ගැන සඳහන් කරන බයිබලීය පාඨවල දැක්වෙන දුක් උසුලන සේවක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න

දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය ලබා සිටියි / මෘදු ලීලාවකින් ක්‍රියා කරයි / දුක් වේදනා දරාගනියි. / පීඩාවට ලක් වූවන් තවත් පීඩාවට ලක් නොකරයි / මැදහත්කාරකම් කරයි / කලකිරීමට ලක් නොවී යුක්ති සහගතව ක්‍රියා කරයි / සිත් ඇදගන්නා රූපයක් නැත / අප වෙනුවෙන් ලබන පහර වලින් අපට සුවය ලැබේ / අපගේ පව් කමාකරන පූජාවීමේ මරණයකි

**(ලකුණු** 02)

**(ii)** පැරණි ගිවිසුමේ දුක් උසුලන සේවකයන් **තිදෙනෙක්** නම් කර, එක් එක් අයගේ ජීවිත පසුබිම දක්වන**එක්** කරුණ බැගින් ඉදිරිපත් කරන්න.

**ජෝබ් -** රෝගීව වේදනා විඳීම හා සියල්ල අහිමි වීම / දෙවියන් වහන්සේ කෙරෙහි පූර්ණ ඇදහිල්ල හා බලාපොරොත්තුව තිබීම.

**ජෙරමියා** - රජුන්ට හා ජනතාවට නොබියව දිවැස් වැකි ප්‍රකාශ කිරීම නිසා දුර්ගන්ධයෙන් පිරී වළකට දමා ජාති විරෝධී පුද්ගලයකු ලෙස සැලකීම / බබිලෝනියාවේ විසූ ඊශ්‍රායෙල් ජනතාවට නැවත පැමිණීමේ බලාපොරොත්තුවක් දීම.

**ඉශ්‍රායෙල් ජනතාව -** මිසරයේ වහල්භාවයට පත්වීම දුක් විඳීම /දුඛිත බව දුටු දෙවියන් වහන්සේ මෝසෙස්ගේ නායකත්වයෙන් වහල්බවින් මුදා පොරොන්දු දේශයට ගෙන ඒම.

**(ලකුණු** 03)

**(iii)** දුක් විඳීම හා කිතුනු ජීවිතය අතර ඇති සම්බන්ධතාවය, බයිබලීය සේවක ගීත පාඨ තුළ ගැබ් වී ඇති සත්‍යයක් **පහක්** ඇදුරෙක් විස්තර කරන්න.

* සැර පරුෂගති වෙනුවට - මෘදු ලීලාවකින් ක්‍රියා කිරිම.
* දුක්වේදනා දරාගනියි - ප්‍රීතියෙන් දුක් වේදනා දරාගනියි.
* පීඩාවට ලක්වූවන් තවත් පීඩාවට ලක් නොකරයි - පීඩාවට ලක්වූවන් හට පිහිට වීම.
* ඕැදහත්කාරකම් කරයි - පාපයෙන් මුදා ගැනීමට ඔවුන් වෙනුවෙන් හඬක් නැගීම.

* යුක්ති සහගතව ක්‍රියා කරයි - අසාධාරණය හා අයුක්තිය වෙනුවට සාධාරණය හා යුක්තිය ක්‍රියා කරයි.
* අපට සුවය ලැබේ - අපගේ රෝග දුක් බර උසුලයි / රෝගී වූ අයගේ සුවය උදෙසා මෙහෙවරක නිරත වීම.
* අපගේ පව් කමා කරන පූජා වීමේ මරණයකි. - පාපයෙන් ගැළවීම හා සදාතන ජීවනය.
* මමත්වයෙන් බැහැරව පරාර්ථකාමී සේවයකට ඇතුළත්වීම.
* අපගේ දුක් පීඩා ප්‍රීතියෙන් දරාගනිමින් දේව කැමැත්තට අනුව ක්‍රියා කිරීම.
* සේවයේ දී දුක් පීඩා අභියෝගයට මුහුණ දීමට සිදුවන බවත් ඒවා සියල්ල මැද මෙහෙවර කළ යුතුය.

**(ලකුණු** 05)
**(මුළු ලකුණු** 10)

6. **(i)** පාවුල්තුමාගේ පළමුවන ධර්මදූත මෙහෙවර සඳහා ඔහු සමග ගමන්ගත් **දෙදෙනෙකු** නම් කරන්න.

* බාර්ණබස් සහ ජොහාන් මාර්ක්

**(ලකුණු** 02)

**(ii)** මෙම පළමු ධර්මදූත මෙහෙවරේ දී පහත සඳහන් ස්ථානයන්හි සිදුවූ වැදගත් සිදුවීම බැගින් සඳහන් කරන්න.

(අ) සලමිසය (ආ) පපස් (ඉ) ලුස්ත්‍රාව

(අ) සලමිසය - පාවුල් හා බාර්ණබස් ජුදෙව් ධර්මශාලාවලට ගොස් දෙවියන් වහන්සේගේ වචන ප්‍රකාශ කිරීම/ජොහාන් මාර්ක් එක්වීම/හවුල් නායකත්වයේ වැදගත්කම තහවුරු විය.

(ආ) පාපස් - සර්ගයිස් පාවුලස් නමැති දේශාධිපතියාව බාර් ජේසුස් නම් ඉන්ද්‍රජාලිකයා සත්‍යයට යොමු වීම වැලැක්වීම - හවුල් නායකත්වයෙන් සත්‍ය වටහා දී ශුද්ධාත්ම බලයෙන් ඉන්ද්‍රජාලිකයාව මෙල්ල කිරීම / දේශාධිපතියා හා ජනතාව දේව වචනය පිළිගැනීම / සාවුල්ට ඔහුගේ ග්‍රීක නම වන පාවුල් ලෙස භාවිතා කිරීම මෙතැන් සිට ඇරඹේ.

(ඉ) ලුස්ත්‍රාව - මව්කුසේ පටන් කොර වූ මිනිසාට සුවය / දෙවිවරු ලෙස සිතා මල් මාලා දැමීම / දෙවියන් වහන්සේට හිමි ගෞරවය උන්වහන්සේට දීම / පාවුල්ට හර්මීස් ද බාර්ණබස්ට සියුස් ද කියා නම් දීම / ඔබ හා සමාන මිනිසුන් බව දන්වමින් ජේසුස් වහන්සේ ගැන දේශනා කිරීම / පාවුල්ට ගල් ගැසීම.

**(ලකුණු** 03)

**(iii)** (අ) ඉහත සඳහන් ස්ථානයන්හී පාවුල්තුමාගේ ක්‍රියාකාරකම් ඇසුරෙන් කිතුනු මෙහෙවරෙහි යෙදෙන සේවකයන් ලබන ආදර්ශ **පහක්** ලියන්න.

(ආ) එම ආදර්ශ වර්තමාන කිතුනු මෙහෙවරෙහි යෙදෙන සේවකයන් ක්‍රියාත්මක කරන අන්දම පහදන්න.

* නායකත්වයේ විශේෂ ගුණාංග - හවුල් නායකත්වය - පාසලේ දී හා සමාජයේ දී එකමුතුව ක්‍රියා කිරීම
* විවිධ අභියෝගවලට මුහුණ දීම - පාපස්හි ඉන්ද්‍රජාලිකයා මර්ධනය කිරීම මෙන් වැරදි ක්‍රියාවන්ට එරෙහිව නිවැරදි ලෙස ක්‍රියා කිරීම.
* දෙවියන් වහන්සේට හිමි ගෞරවය පිදීම - ලුස්ත්‍රාවේ දී / සෑම යහපත් දේ ගැන දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම හා දේව ගෞරවය පිණිස ඉටු කිරීම. / ශක්තියෙන් නොව අපේ සියලු ජය ගැනීම් වලට දෙවියන් වහන්සේගේ පිහිට අවශ්‍ය බව වටහා ගෙන ස්තුති කිරීම.

* අධෛර්ය නොවී පීඩා මධ්‍යයේ ඉදිරියට යාම - ගල් ගසා පලවා හැරීම / කිතුනු මෙහෙවර අභියෝග මැද වුව ද සිදු කිරීම.

* නිහතමානීව ජනප්‍රියතාවයෙන් තොරව ක්‍රියා කිරීම - අපගේ හැකියාවන් ගැන ආඩම්බර නොවී දේව ගෞරවය පිණිස භාවිතා කිරීම.

* යුක්තියට නැගී සිටීම - වැරදි චෝදනා එල්ල වූ විට සත්‍ය පහදා දීම වෙනත් සිසුවකුට අනිසි චෝදනා එල්ල වූ අවස්ථාවකදී ඒ වෙනුවෙන් නැගී සිටීම.

* නගර වලින් පිටත දැමුවද පාවුල් ධෛර්යයෙන් නැවත එම ස්ථාන වල සේවයේ යෙදීම මෙන් සත්‍ය වෙනුවෙන් පුන පුනා ක්‍රියා කිරීම ද පාසැල තුළ සිදුවන පසුබෑම් නොතකා එය අවම කරන තෙක් වෙහෙසීම

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

7 පහත සඳහන් මතෘකා අතුරෙන් **දෙකක්** තෝරා ගෙන, බයිබලීය ඉගැන්වීම් පදනම් කරගනිමින් කෙටි සටහන් ලියන්න.

(i) සුව කිරීම.

(ii) ජේසුස් වහන්සේගේ නාසරත් දේශනයෙන් ඉස්මතු වන ඉගැන්වීම්

(iii) නිකදෙමුස් සහ ජේසුස් වහන්සේ

(iv) හවුල් නායකත්වය

**(i)** **සුව කිරීම** - ජේසුස් වහන්සේගේ දයානුකම්පාව නිරන්තරයෙන් රෝගීන් වෙත පිරිනැමිණ.

ශාරීරික රෝගාබාධ / අන්ධභාවය / බිහිරිභාවය / ගොළුභාවය / අංශභාග ශා ලාදුරු වැනි රෝග විවිධ රෝගීන් සුව කිරීම තුළින් ජේසුස් වහන්සේගේ දේව රාජ්‍යයේ ලකුණු විදහා පෑ සේක.

අදත් රෝගීන් වෙනුවෙන් යාච්ඤා කිරීමට අපට හැකි වීම. / ඔවුන් බැලීමට ගොස් සහනය සැලසීම.

**(ලකුණු 05)**

**(i)** **ජේසුස් වහන්සේගේ නාසරෙත් හී දේශනයෙන් ඉස්මතු වන ඉගැනවීම්**

* **දිළිඳුන්ට සුභාරංචිය දේශනා කිරීම** - කන්ද උඩ දේශනාව / මිටියාවතේ දේශනාව / දිළිඳු ජනයා උන්වහන්සේ වෙත පැමිණීම හා ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම අප ද එවැනි අයව හඳුනාගෙන උපකාරය දැක්වීම / සුභාරංචිය ප්‍රකාශ කිරීම.

* **වහලුන්ට මිදීම** - සමාජයේ වහල් බැම්වලින් මුදා ගැනීම (මත් ද්‍රව්‍ය / අසභ්‍ය දේවලට) වැරදි ක්‍රියාවන් හසු වූ අය / නොමඟ ගිය අය ව එයින් ගලවා ගැනීම.

* **අන්ධයන්ට පෙනීම** - ආත්මික අන්ධභාවයෙන් සිටින අයව දේව වචනය තුළින් නිවැරදි දැක්මකට ගෙන ඒම / දේව වචනය නොදන්නා අයට එය ඉගැන්වීම.

* **පීඩිත වූවන් මුදාලීම** - සමාජීය හා ආර්ථික විවිධ හේතු මත පීඩාවට පත් වූ අය සොයා ඔවුන් එම පීඩාවන්ගෙන් මුදාලීමේ වැඩ පිළිවෙලක් සභාවේ දායකත්වය ඇතිව ක්‍රියාත්මක කිරීම / ඔවුන්ගේ ජීවිත නගා සිටුවීම.

**(ලකුණු 05)**

**(iii) නිකදෙමුස් හා ජේසුස් වහන්සේ** - පරිසිවරුන් ප්‍රධානියෙක් / ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් ගැන පැහැදී සිටියහ. රාත්‍රී කාලයේ දී ජේසුස් වහන්සේ මුණ ගැසීමට පැමිණීම / ආත්මික ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමේ අවශ්‍යතාවක් ඔහු සතුවිය / ජේසුස් වහන්සේ රාත්‍රී කාලයේ දී වුව ද ඔහුගේ අවශ්‍යතාවයට සවන් දුන් සේක. / "යමෙක් නැවත නූපන්නොත් ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැක ගත නොහැක." පැවසීම. මෙහි ගැඹුරු සත්‍ය නිකදෙමුස්ට වටහා ගැනීමට අපහමු විය.

පාපයට බරව ජීවත් වන මිනිසා එයින් මිදීම 'නැවත ඉපදීම' ලෙස වටහා දී අලුත් ජීවිතයක් අත්පත් කර ගැනීමට ආරාධනා කරයි.

* කිතුනු අපද පාපයෙන් මිදී අභ්‍යන්තර වෙනසක් ඇතිව දේව රාජ්‍යයේ ඉගැන්වීම් අනුව ජීවත් විය යුතුය.

* උන්වහන්සේට ප්‍රේම කරමින් දේව රාජ්‍යයේ උරුමය (සදාතන ජීවනය) අත්පත් කරගැනීමේ අභියෝගයට මුහුණ දිය යුතුය.

**(ලකුණු 05)**

**(iv) හවුල් නායකත්වය** - පාවුල්, බාර්ණබස් හා ජොහාන් මාර්ක් පළමු ධර්මදූත ගමනේ යෙදීම / අභියෝග හමුවේ සාමුහිකව මුහුණ දීමට හැකිවීම / සහයෝගයෙන් ක්‍රියා කිරීමට හැකිවීම / ජේසුස් වහන්සේ ද තම ගෝලයන් සමඟ ක්‍රියා කිරීම.

කිතුනු අප ද නායකත්වය දැරීමේ දී අන් අය සමඟ සාමුහිකව ක්‍රියා කිරීම / සේවක ස්වරූපයෙන් සේවය කිරීමට මඟපෙන්වීම / බාධක ඉදිරියේ නොසැලී සිටීමට දිරිය හා ශක්තිය

**(ලකුණු 05)**
***(මුළු ලකුණු 10)***

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ
ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසම,
368/6, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07

දුරකථන අංකය- 011 2679343
ෆැක්ස් අංකය - 0112671721
විද්‍යුත් තැපෑල - edu@nccsl.org